	මැණික් හා මැණික් ආයතනයට අත්තිකාරම් ගෙවීම		200,000.00	200,000
			765,516,000.00	**765,516,000**
	හානි පාඩු සඳහා වෙන්කිරීම්		(200,000.00)	(200,000)
			765,316,000.00	**765,316,000**
8	**විකිණිය හැකි මූල්‍ය වත්කම්**			
	ලැයිස්තුගත නොකළ ආයෝජන	**(සටහන 8.1)**	**1,200,010**	**1,200,010**

		කොටස් සංඛ්‍යාව		
8.1	**ලැයිස්තුගත නොකළ ආයෝජන**			
	සීමාසහිත ලංකා එක්සත් පුවත්පත් සමාගම	20,000	200,000.00	200,000
	ජී එස් එම් බී තාක්ෂණික සේවා (පුද්) සමාගම	100,000	1,000,000.00	1,000,000
	එල් ජී එල් (පුද්) සමාගම	1	10.00	10
			1,200,010.00	**1,200,010**
9	**භාණ්ඩ තොග**			
	පාරිභෝගික භාණ්ඩ		6,770,111.98	4,948,012
	මැණික් - ගෙවුඩ මධ්‍යස්ථානය		183,547.54	183,548
	මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය තොගය		4,516,390.40	3,962,782
			11,470,049.92	**9,094,341**
10	**ලැබිය යුතු දෑ**			
	ලැබිය යුතු දෑ		177,356,234.38	182,745,114
	හානි පාඩු සඳහා වෙන් කිරීම්		(1,407,972.00)	(1,407,972)
			175,948,262.38	**181,337,142**
	පෙර ගෙවීම්		17,125,989.39	29,028,312
			193,074,251.77	**210,365,454**
11	**කල්පිරෙන තෙක් තූ ආයෝජන(HTM)**			
	ක්‍රමක්ෂිත පිරිවැයට ධාරණ වටිනාකම			
	භාණ්ඩාගාර බිල්පත්	ලංකා බැංකුව	**1,589,772,959.41**	**1,363,471,221**
		මහජන බැංකුව	**2,144,878,607.68**	**1,568,884,252**
			3,734,651,567.09	**2,932,355,473**
12	**තැන්පතු හා අත්තිකාරම්**			
	පොදු තැන්පතු		176,938,461.30	176,245,361
	වෙනත්		30,725.00	30,725
	ආරක්ෂිත තැන්පතු		61,500.00	61,500
			177,030,686.30	**176,337,586**
	හානි පාඩු සඳහා වෙන් කිරීම්		(1,433,947.00)	(1,433,947)
			175,596,739.30	**174,903,639**
13	**සේවක ණය හා අත්තිකාරම්**			
	අත්තිකාරම්		60,065.01	103,815
	වැටුප් රහිත නිවාඩු		73,041.31	135,625
	වාහන ණය		4,574.34	4,574
	රෙදිපිළි ණය		75,000.24	75,000
	ආපදා ණය		16,847,873.22	19,179,367
			17,060,554.12	**19,498,381**
14	**අනෙකුත් මූල්‍ය වත්කම්**			
	ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව		646,585,651.67	601,097,539
	මහජන බැංකුව		86,235,595.64	78,978,047
	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව බැංකුව (HDFC)		106,830,172.38	97,814,642
			839,651,419.69	777,890,228
15	**මුදල් හා මුදල් සමාන දෑ**			
	මුදල් මාරු ශේෂයන්		-	709,333
	මුදල් හා බැංකු ශේෂයන් - ශ්‍රී.ලං.රු.		128,185,186.44	132,881,026
	බැංකු ශේෂය - (විදේශ ව්‍යවහාර මුදල්)		4,610,109.94	15,607,944
			132,795,296.38	**149,198,303**

16 දායක ප්‍රාග්ධනය

රාජ්‍ය මැණික් සංස්ථාවේ බැරට පැවැති හා අධිකාරියට පවරන ලද මුදලින් සමන්විත ආරම්භක ප්‍රාගධනයෙන් ප්‍රාග්ධනය නියෝජනය වේ. .

17 මැණික් ගැරමේ සුබ සාධක අරමුදල

අධිකාරිය විසින් මැණික් කර්මාන්තයේ වැඩ කරන කැනැත්තන්ගේ ජීවිත අනතුරුවලින් ආරක්ෂා කිරීම නියම කර ඇති 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 1 කොටසේ 14 (ග) වගන්තියට අනුකූලව 2008 වසරේ සිය සහ අනතුරුව 2015 වසරේ සිට මැණික් ගරන්නන්ගෙන් මෙම අරමුදල රැස් කර ඇත.

18 ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල

ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනයට සහාය වීම පිණිස 2007 වසරේ අයවැය යෝජනාවලින් යෝජිත පරිදි ස්වර්ණාභරණ නිෂ්පාදකයන්ගෙන් එකතු කරන ලද රු. 5,000 ක වාර්ෂික ලියාපදිංචි වීමේ ගාස්තුව මෙයින් නියෝජනය වේ. මෙම අරමුදල ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා යොදා ගෙන ඇත.

19 මැණික් ත්‍යාග අරමුදල

1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ IV කොටසේ 52 වගන්තිය මගින් නියම කර ඇති පරිදි වරදක් සමථයට පත් කිරීමේදී දඩ වශයෙන් පාර්ශවකරුවන්ගෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් මෙයින් නියෝජනය වේ. අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේඛ 824 මගින් උපදෙස් දී ඇති පරිදි වැටලීම් කණ්ඩායම් හා සේවකයන්ට ත්‍යාග ලබා දීම පිණිස මෙම අරමුදල නඩත්තු කරනු ලබයි.

20 මැණික් ප්‍රත්‍යාගණන සංචිතය

ලදර්ශන භාණ්ඩ ලෙස භාවිතා කරනු ලැබූ මැණික් ගල්වල ප්‍රත්‍යාගණන සංචිතය මෙයින් නියෝජනය වේ.

21 ප්‍රත්‍යාගණන සංචිතය

ප්‍රත්‍යාගණන සංචිතය අදාළ වනුයේ ඉඩම්, ගොඩනැගිලිවල හා මෝටර් රථ ප්‍රත්‍යාගණන අතිරික්තයට වන අතර අදාළ ප්‍රත්‍යාගණිත වත්කම් අපහරණය කළ පසු ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් කොටසක් රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලබයි.

22 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

	2024	2023
ජනවාරි 01 දිනට ශේෂය	**33,991,603.78**	**36,338,771**
විස්තිරණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබූ වියදම **සටහන 22.1**	**22,723,599.61**	**3,622,338**
2024 වසරේ ගෙවූ ප්‍රතිලාභ	(6,294,397.50)	(5,969,505)
2024 වසරේ සිදු කළ ගැලපීම්	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**50,420,805.89**	**33,991,604**

22.1 විස්තිරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්

පොලී පිරිවැය	3,654,097.40	5,160,105
වර්ෂය සඳහා අයකිරීම	2,800,910.17	1,805,979
උපකල්පන වෙනස්වීමෙන් පැන නගින (ලාභ)/අලාභ	16,268,592.04	(3,343,746)
	22,723,599.61	**3,622,338**

අධිකාරිය විසින් වර්ධනය කරනු ලැබ ඇති මෙම උපකල්පන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මැණිම පිණිස භාවිතා කරනු ලැබූ විවල්‍යයන් පිළිබඳ කළමනාකාරිත්වයේ හොඳම ඇස්තමේන්තු මත පදනම්ව ඇත.

යොදා ගනු ලැබූ ප්‍රධාන උපකල්පන පහත දැක්වෙන පරිදි වේ.

වට්ටම් අනුපාතය [%]	11	12
අනාගත වැටුප වැඩිවීම් සාමාන්‍යය [%]	1.3	1.3
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය [%]	2.5	2.5
විශ්‍රාම වයස [අවුරුදු]	60	60

වසර ආරම්භයේ පැවැති වට්ටම් අනුපාතය වූ 12% ගණනය කිරීම් සඳහා යොදා ගෙන ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 84 ඡේදය මගින් නිර්දේශ කර ඇති පරිදි වත්මන් අර්බුදය හේතුවෙන් පැවැති අතිශයින් ඉහළ වෙළඳ පොළ අනුපාතය ඉවත් කිරීම පිණිස එය යොදා ගනු ලැබුණි.

		2024	2023
23	**කල්බදු ගෙවීම් සඳහා වූ වගකීම**		
	දළ වගකීම		
	ජනවාරි 01 දිනට	**198,107.00**	**296,825**
	වර්ෂය තුල හඳුනාගත්	-	-
	වසර තුළ සිදුකළ ගෙවීම්	(59,230.00)	(39,488)
	දෙසැම්බර් 31 දිනට	**138,877.00**	**257,337**
	මූල්‍ය පිරිවැය		
	ජනවාරි 01 දිනට	**350,794.00**	**292,417**
	වර්ෂය තුල හඳුනාගත්	-	-
	වර්ෂය තුළ විස්තීරණ ආදායමේ හඳුනාගනු ලැබූ මූල්‍ය පිරිවැය	(58,501.00)	-
	අනාගත කාල සීමාවන්ට වෙන් කරනු ලැබූ මූල්‍ය පිරිවැය	**292,293.00**	**292,417**
	දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම	**153,416.00**	**35,080**
	23.1 වගකීම් වර්ගීකරණය		
	වර්ෂයක් තුල පියවිය යුතු		
	දළ වගකීම්	59,900.00	59,900
	අනාගත කාලපරිච්ඡේද සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය පිරිවැය	(58,607.00)	(58,501)
		1,293.00	**1,399**
	වර්ෂයක් ඉක්මවීමෙන් පියවිය යුතු		
	පියවීම වර්ෂ දෙක සහ පහ අතර		
	දළ වගකීම්	59,231.00	118,463
	අනාගත කාලපරිච්ඡේද සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය පිරිවැය	(59,231.00)	(118,463)
		-	-
	පියවීම වර්ෂ පහ ඉක්මවූ		
	දළ වගකීම	533.00	1,158
	අනාගත කාලපරිච්ඡේද සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය පිරිවැය	-	-
		533.00	**1,158**
	වර්ෂයක් ඉක්මවා පියවිය යුතු වගකීම් එකතුව	**533.00**	**1,158**
	දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම් එකතුව	**1,826.00**	**2,557**
24	**ගෙවිය යුතු දෑ**		
	ණය හිමියන්	353,379,225.06	308,994,210
	කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා ගත් මුදල්	10,156,915.60	10,156,916
	අනිකුත්	16,878,292.26	13,434,123
		380,414,432.92	**332,585,248**

			2024	2023
25	**තැන්පතු හා අත්තිකාරම් ලැබීම්**			
	සේවක ආරක්ෂිත තැන්පතු		111,500.00	111,500
	ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම්		15,896.26	15,896
	කලින් ලද ලැබීම්		5,845,280.00	16,471,500
	ඉඩම් ආරවුල් තැන්පතු		144,099,070.63	128,267,437
	ටෙන්ඩර තැන්පතුව		11,168,580.00	11,340,580
	සාප්පු හිමියන්ගේ තැන්පතුව ලෝ.වෙ.ම/ වෙනත්		10,067,072.94	7,844,673
	වැණික් කෞතුකාගාර අරමුදල		125,997.00	125,997
	අපනයන කොමිස් තැන්පතු		465,992.78	543,000
	වෛද්‍ය යෝජනා ක්‍රම අරමුදල		460,993.29	460,993
			172,360,382.90	**165,181,576**
26	**ව්‍යවස්ථාපිත ගොවිය යුතු දෑ**			
		(සටහන		
	සංස්ථාපිත බදු	**26.1)**	120,682,689.45	188,613,814
	එකතු කළ අගය මත බදු		1,592,752.19	9,172,096
	රැඳවුම් බදු		1,524,519.38	(672,927)
	රඳවා ගත් මැණික් වෙන්දේසි බදු 2.5%		1,004,923,963.87	784,551,426
	ආර්ථික සේවා බදු			
	ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු		-	107,301
	මුද්දර ගාස්තු		3,653,650.62	2,433,951
	සමාජ ආරක්ෂණ දායක බදු		1,320,359.54	1,427,091
			1,133,697,935.05	**985,632,752**

26.1 සංස්ථාපිත බදු

ජනවාරි 01 දිනට ශේෂය	188,613,814.11	92,558,965
වර්ෂය සඳහා වර්තන බදු	140,050,573.05	193,350,062
වසර තුළ ගෙවීම් - පසුගිය වසර බැඳීම් පියවීම	(181,362,634.00)	(98,606,760)
- ස්ව තක්සේරු ගෙවීම්	(11,250,000.00)	(8,625,000)
බදු බැර - ආර්ථික සේවා ගාස්තු	-	-
- රඳවාගත් බදු	(15,671,515.71)	-
- ජාතික බදු	-	-
පසුගිය වර්ෂය සඳහා වූ අධි/(ඌණ)/ වෙන්කිරීම් මත ගැලපීම	302,452.00	9,936,548
දෙසැම්බර් 31 දිනට ශේෂය	**120,682,689.45**	**188,613,814**

27	**වෙන්කිරීම් සහ උපචිත වියදම්**		
	උපචිත වියදම්	79,622,087.06	106,992,125
		79,622,087.06	**106,992,125**

28 ආදායම්

	2024	2023
ඉඩම් වෙන්දේසිය - රජයේ ඉඩම්	17,230,000.00	216,805,782
ඉඩම් වෙන්දේසිය -ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	-	60,029,252
සේවා හා අභියාචනා බලපත්‍ර ගාස්තු	1,760,000.00	2,219,100
මැණික් ගැරීමේ බලපත්‍ර ගාස්තු	97,506,738.00	93,066,081
වෙළඳ බලපත්‍ර ගාස්තු	144,142,812.20	112,211,536
ත්‍යාග හා නියැදි සඳහා සේවා ගාස්තු	3,000.00	7,000
මැණික් සහස්වර්ණාභරණ අපනයන සේවා ගාස්තුව	176,342,760.87	232,522,670
මැණික් කැපීමේ බලපත්‍ර ගාස්තු	592,088.00	530,818
සේවා ගාස්තුව - ගෙවුඩ අපනයන	37,591.11	4,425,735
LDO ඉඩම / ඔනිජ බද්ද	13,021,000.00	13,162,000
සමඵ ගාස්තු මඟින් ආදායම	44,979,771.78	40,349,057
මැණික් වෙන්දේස් බලපත්‍ර	5,745,000.00	4,118,000
මැණික් පරීක්ෂා කිරීමේ ගාස්තු	15,941,785.35	16,294,836
මැණික් තත්ත්ව මුද්‍රා කාර්යාලයෙන් ලත් ආදායම	19,533,839.60	32,904,596
බලපත්‍ර පිටපත් කිරීමේ ගාස්තු	164,004.00	131,062
සේවා ගාස්තුව - කටුනායක දියමන්ති මධ්‍යස්ථානය	12,015,234.38	20,756,047
මැණික් පාර්සල් නිශ්කාෂණයෙන් ලත් ආදායම	2,232,987.00	3,052,143
පරිසර ආරක්ෂණය	135,000.00	255,000
BACO සේවා ගාස්තු	89,853,400.00	72,182,000
පරීක්ෂා කිරීමේ ගාස්තු	126,927,400.00	91,899,600
වර්ණ කාඩ්පත් මඟින් ආදායම	12,980,500.00	10,773,600
රාජසන්තක කරන ලද ඇප	11,097,500.00	20,479,500
ඉල්ලම් ප්‍රවාහන බලපත්‍ර ආදායම	1,166,500.00	2,135,500
මැණික් ප්‍රවාහන ගාස්තු ආදායම	105,550.00	115,785
ඉංජිනේරුවන් සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තු	35,370,000.00	31,070,900
වීසා ගාස්තු ආදායම	3,021,635.16	1,564,544
මැණික් ගැරීම සඳහා යන්ත්‍රෝපකරණ ගාස්තුව	1,490,000.00	1,261,400
	833,396,097.45	**1,084,323,544**

29 අනෙකුත් ආදායම්

විවිධ ආදායම	818,352.53	2,806,462
ලෝක වෙළඳ මධ්‍යස්ථානය සහ රත්නපුර කුටි	8,918,070.70	1,910,842
පොත් අලෙවිය	54,050.00	109,275
ලාභාංශ	8,197,974.60	4,547,254
කුලී ආදායම	105,609,075.28	7,307,289
වෙන්දේසි කළ භාණ්ඩවල ආදායම	103,500.00	3,097,150
ස්ථාවර වත්කම් අපහරණය මත ලාභය	-	415,800
රක්ෂණ නියෝජිතායතනවලින් ආදායම	405,361.70	452,832
ප්‍රදර්ශන වියදම් - විදේශ / දේශීය (අය කර ගන්නා ලද)	12,100,213.00	4,750,605
	136,206,597.81	**25,397,509**

2024 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

		2024	2023
30	**පරිපාලන වියදම්**		
	දායක මුදල්	1,946,849.39	1,751,495
	සංග්‍රහ (දේශීය)	2,592,473.94	3,311,274
	දුරකථන ගාස්තු	3,580,587.20	3,607,743
	තැපැල් ගාස්තු හා මුද්දර	2,942,832.69	2,903,553
	අන්තර්ජාල ගාස්තු	5,328,504.04	4,620,036
	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වියදම්	2,151,000.00	2,614,000
	කුලිය	68,261,126.44	64,365,412
	විදුලිය	23,035,689.08	21,965,905
	වරිපනම් හා බදු	1,333,643.06	76,823
	පුවත්පත් හා වාර ප්‍රකාශන	260,520.00	314,070
	ජල බද්ද සහ ගාස්තු	3,325,171.29	2,233,504
	වෙළඳ ප්‍රචාරණය	1,004,272.00	2,917,685
	ප්‍රවාහන	971,703.59	941,131
	රක්ෂණ	2,116,323.01	2,682,945
	නෛතික ගාස්තු	4,625,368.00	3,630,768
	වර්ෂය සඳහා විගණන ගාස්තු	1,200,000.00	1,200,000
	මිනුම් ගාස්තු	502,844.00	728,900
	කළමනාකරණ උපදේශන	233,900.00	268,963
	ගොඩනැගිලි නඩත්තුව	9,447,082.37	9,846,817
	උපකරණ නඩත්තුව	9,149,469.35	6,865,707
	ආරක්ෂක සේවා	21,805,411.30	21,590,368
	සම්මන්ත්‍රණ හා පුහුණු (දේශීය)	261,255.00	991,774
	සම්මන්ත්‍රණ හා පුහුණු (විදේශීය)	90,000.00	230,401
	වැටලීම් වියදම්	565,620.00	1,380,880
	පර්යේෂණ හා සංවර්ධන වියදම්	1,262,463.00	-
	පොදු වෙන්දේසි වියදම්	2,609,549.89	2,822,725
	පරිත්‍යාග	7,500.00	100,000
	පාරිභෝජ්‍ය වත්කම්	505,035.00	114,945
	කාර්යාල සැපයුම්	13,207,703.47	8,854,433
	පරිහරණය සඳහා අයිතිය ඇති ඉඩමේ ක්‍රමක්ෂය	2,364.00	2,364
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	9,304,275.94	7,609,712
	විද්‍යාගාර සැපයුම්	2,597,773.60	349,090
	පාරිසරික වියදම්	6,000.00	19,000
	ක්ෂය	80,312,219.22	70,695,281
	රථ වාහන නඩත්තුව	19,870,737.92	15,861,473
	තෙල් හා ඉන්ධන	21,301,499.06	25,447,219
	ටයර් සහ ටියුබ්	2,328,174.06	2,504,530
	රථ වාහන බලපත්‍ර හා රක්ෂණය	1,046,189.08	709,138
	සාමාන්‍ය වියදම්	25,408.48	220,110
	ව්‍යාපෘති වියදම්	562,720.85	3,323,707
	බැංකු ගාස්තු	2,958,250.71	2,729,127
	හිමිකම් නොපෑ සමාජ ආරක්ෂණ දායක බද්ද	2,529,379.87	1,372,987
	මැණික් ගරන්නන්ගේ ශිෂ්‍යත්ව වියදම්	2,881,000.00	10,102,500
	මැණික් ඉඩම් පුනරුත්ථාපනය	1,550,000.00	-
		331,599,889.90	**313,878,495**

		2024	2023
31	**සේවක වියදම්**		
	වැටුප් හා දීමනා	166,391,292.20	133,020,633
	වැඩ බැලීමේ දීමනා / අවදානම් දීමනා	802,935.84	501,149
	සේ.අ.අරමුදලට යටත් නොවන වැටුප් හා දීමනා	20,478,443.55	19,977,067
	සේවක අර්ථසාධක අරමුදල	26,855,376.20	21,084,120
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	5,371,075.32	4,216,824
	අතිකාල	6,958,980.51	7,095,098
	නිවාඩු දින වැඩ කිරීම වෙනුවෙන් ගෙවීම්	39,077.99	83,404
	සම්මාන (රන් පදක්කම්)	-	1,510,800
	නිවාඩු ප්‍රසාද දීමනා	10,253,255.61	9,627,695
	කාර්ය මණ්ඩල නිවාස ණය සඳහා ගෙවන ලද පොලිය	106,158.00	107,539
	සේවක දිරි දීමනා	30,501,420.75	76,397,000
	පාරිතෝෂික	6,455,007.57	6,966,084
	ගමන් ගාස්තු (දේශීය)	3,485,496.74	2,722,704
	කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම්	260,460.00	529,684
	කාර්ය මණ්ඩල සුබ සාධනය	17,783,659.27	17,524,734
	කම්කරු වන්දි	189,618.00	-
	වෛද්‍ය ගාස්තු	22,643,657.00	21,304,938
	ප්‍රවාහන දීමනා	26,660,050.00	13,010,000
		345,235,964.55	**335,679,475**
32	**ප්‍රවර්ධන වියදම්**		
	ගමන් ගාස්තු -විදේශීය	43,780.00	2,083,898
	ප්‍රදර්ශන වියදම් - දේශීය	26,477,954.41	31,516,934
	ප්‍රදර්ශන වියදම් - විදේශීය	34,131,516.95	11,961,787
	ප්‍රචාරණ - දේශීය	2,173,535.00	5,940,594
	ප්‍රචාරණ - විදේශීය	2,796,260.00	55,800
	ප්‍රවර්ධන වියදම්	18,036,873.49	3,815,416
		83,659,919.85	**55,374,430**
33	**ශුද්ධ මූල්‍ය ආදායම්**		
	පොලී ආදායම		
	ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් මත පොලිය	397,815,907.95	590,063,592
	කාර්ය මණ්ඩල ණය මත පොලිය	712,399.86	636,162
		398,528,307.81	**590,699,754**
	පොලී වියදම්		
	කල්බදු ගෙවීම් සිදු කිරීමේ බැඳීම් මත මූල්‍ය පිරිවැය	(58,501.00)	(58,377)
		(58,501.00)	**(58,377)**
		398,469,806.81	**590,641,377**

			2024	2023
34	**ආදායම බදු වියදම**			
	වර්තමාන බදු වියදම්	**(සටහන 34.1)**	140,050,573.05	193,350,061
	පසුගිය වසර සඳහා (ඌණ)/අධි වෙන්කිරීම් මත ගැලපීම්		302,452.00	9,936,548
	විලම්බිත ගැලපීම්	**(සටහන 6)**	(21,897,065.50)	10,056,286
			118,455,959.55	**213,342,895**
	34.1 වර්තන බදු වියදම් සහ ගිණුම් ලාභ ඉපැයීම් අතර සැසඳීම			
	ඒකාබද්ධ අරමුදලට දායක ගෙවීමෙන් පසු බදු ගෙවීමට පෙර ලාභය		**446,308,136**	**645,430,030**
	ඉඩ නොදෙන අයිතමයන් එකතුව		250,741,950.00	427,736,432
	ඉඩ දිය හැකි අයිතමයන් එකතුව		(77,016,868.00)	(74,119,003)
	අනිකුත් ප්‍රභවයන්ගෙන් ආදායම්		(521,194,927.00)	(604,465,139)
	වෙළඳ හෝ ව්‍යාපාර කටයුතු වලින් ලාභය/ (අලාභය)		**98,838,291**	**394,582,320**
	බදු සඳහා අදාළ අනිකුත් ආදායම් - පොලී ආදායම්		512,996,952.80	599,917,885
	එකතු ව්‍යවස්ථාපිත ආදායම්		**611,835,243.50**	**994,500,205**
	සුදුසුකම් ලබන ගෙවීම්		(145,000,000.00)	(350,000,000)
	බදු පාඩු උපයෝජන			
	තක්සේරුගත ආදායම් / බදු අය කළ හැකි ආදායම්		**466,835,244**	**644,500,205**
	ව්‍යවස්ථාපිත බදු අනුපාතය වූ 30% මත බදු ගාස්තු		140,050,573	193,350,061
	බෙදිය හැකි ලාභ මත බදු		-	-
	වර්ෂය සඳහා සාමාන්‍ය කටයුතු මත වර්තන බදු		**140,050,573**	**193,350,061**

35 ප්‍රාග්ධන හා අනෙකුත් බැඳීම්

දමුණුවත්ත ගොඩනැගිල්ල හා රත්නපුර ගොඩනැගිල්ල ඉදිකිරීමට සහ නිමා කරන ලද සහ සහතික කරන ලද වැඩ 60% භාවිතා කරමින් පෙන්වන ලද මිලියන 10.45 ක් වූ පරිගණක මෘදුකාංග පැකේජයට අදාළව අතුරු දීමනා සඳහා නොනිම් වැඩ වියදම් සිදු කර ඇත.

36 වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසු ඇතිවන සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසුව ප්‍රදර්ශන මැණික් ගල් ප්‍රත්‍යාගණනය කළ අතර ප්‍රත්‍යාගණිත මුදල රු. 765,316,000.00 ක් වේ.

37 අසම්භාව්‍ය බැරකම්

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී පැන නගින නෛතික හිමිකම්වලට අදාළව අධිකාරිය සතුව අසම්භාව්‍ය බැරකම් තිබේ. ප්‍රතිපාදනයක් (සටහන 27) ලෙස හඳුනා ගන්නේ නම් මිස, මෙම හිමිකම් පෑම් සාධාරණය කළ නොහැකි සහ ඒවා පියවීම සඳහා සම්පත් පිටතට ගලා යාමේ සම්භාවිතාව ඉතා දුරස්ථ බව කළමනාකාරිත්වය සලකයි.
මෙම ඇගයීම අධිකාරියේ නීති අංශයේ උපදෙස් සමග අනකූල වේ.

38 සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම්

අධිකාරියේ සම්බන්ධිත පාර්ශවයන්ට ශ්‍රී ලංකා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධිත ආයතන, රජයට අයත් ව්‍යාපාර සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් ඇතුලත් වේ.
.
ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය සමග එක්ව මැණික් සහ ස්වර්ණාභරණ අපනයන අරමුදලෙන් ලබාගත් මුදලින් සීමාසහිත ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සමාගම ස්ථාපිත කළ අතර 2014 දෙසැම්බර් 31 දිනට අරමුදලේ පැවැති ශේෂය රු 126,512,567.00 ක් විය. .

38.1 ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයන් හා සිදුවූ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 24 "සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම" අනුව, ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු සෘජුව හෝ වක්‍රව ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා වගකීම තිබෙන්නා වූ අය වේ. ඒ අනුව, ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය වර්ගීකරණය කර තිබේ.

ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයන් සමඟ සිදුවූ ගනුදෙනු පහත දක්වා ඇත.	2024	2023
පාරිශ්‍රමික සහ අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ		
සේවා කාලයෙන් පසු ප්‍රතිලාභ	-	-
පශ්චාත් රැකියා ප්‍රතිලාභ		

38.2 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශව සමග සිදු කරන ප්‍රධාන ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

සම්බන්ධිත පාර්ශවය	වාර්තාකරණ කාල සීමාව සඳහා ගනුදෙනුවල ස්වභාවය	ගනුදෙනු වටිනාකම	ශේෂය (කෙවිය යුතු)/ ලැබිය යුතු
රජයට අයත් ව්‍යාපාරික ආයතන	ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය		
	ස්ථාවර සහතික සහ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගැනීම්	(802,296,094.30)	
		(61,761,192)	(864,057,286.20)
	ආපසු මිලදී ගතහැකි ආයෝජන	-	
	(REPO)	-	
අනිකුත් රජය හා සම්බන්ධිත ආයතන	කොටස්වල ආයෝජනය	-	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } IMT/G/NGJA/FA/2024 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2025 අගෝස්තු 06 දින



සභාපති,
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 32 ඡේදය ප්‍රකාරව වත්කම් හා වගකීම් හිලව් කර දැක්විය නොහැකි වුවද අධිකාරිය වෙතින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර කුලියට ලබාගත් කඩ හිමියන්ගෙන් අයවිය යුතු රු.38,017,311ක කුලී ආදායම් කඩ හිමියන්ගේ රු.11,957,994 ක තැන්පතුවලට හිලව් කර රු. 26,059,317 ක් ලැබිය යුතු කුලී ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර කුලියට ලබාගත් කඩ හිමියන්ගෙන් ඉකුත් වර්ෂයට අදාලව ලැබිය යුතු රු.8,922,419 ක කුලිය ඉකුත් වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබීම නිවැරදි කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව ගලපනවා වෙනුවට, සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අධිගණනය වී තිබුණි.

(ඇ) අධිකාරිය ඉදිකල මැණික් කුළුණ ගොඩනැගිල්ලේ කඩ සාප්පු කුලියට දීමේදී සාප්පු 14කට අදාලව අයකරගත් රු.84,565,500 ක් වූ මූලික ලංසු වටිනාකම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව එහි ආර්ථික ප්‍රතිලාභය ලැබෙන කාලය පුරාවට බෙදාහැරිය යුතු වුවද, එසේ හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස හඳුනා ගැනීම නිසා රු.82,655,755 කින් වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 හා 79 ඡේද ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන පිරිවැය රු.127,000,741 ක් වූ වත්කම්වල දළ ධාරණ අගය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් ගිණුම්වල සිදුකර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 14 ඡේදයේ සඳහන් සාධක සපුරා නොතිබියදී අධිකාරියට එරෙහිව බාහිර පාර්ශව විසින් පවරා තිබූ නඩු 05කට අදාලව, රු.7,700,000 ක් ගෙවිය යුතු වන්දි ලෙස 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මෙම ඇස්තමේන්තු වරද නිවැරදි නොකිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ලාභය රු.7,700,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, අධිකාරියට එරෙහිව බාහිර පාර්ශව විසින් පවරා ඇති නඩු 06 කට අදාලව ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂිත වන්දි ලෙස රු.1,029,764,412 ක් පවතින බව අධිකාරියේ නීති නිලධාරී තහවුරු කර තිබුණද ප්‍රමිතියේ 28 ඡේදය ප්‍රකාරව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඊ) ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලට යාබදව පුද්ගලික සමාගමක් විසින් සිදු කරන ලද ඉදිකිරීමක් හේතුවෙන් අධිකාරියේ පරිශ්‍රයෙන් කොටසක් 2021 ජූලි 16 දින ගිලා බැසීම හේතුවෙන් සිදුවී ඇති හානිය රු.මිලියන 100 කට අගය කර එය පූර්ණය කර ගැනීම සඳහා අදාල සමාගමට එරෙහිව අධිකාරිය විසින් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණද ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 34 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 39 හි 58 ඡේදය ප්‍රකාරව සෑම ගිණුම්කරණ කාලපරිච්ඡේදයකදීම වත්කම් හානිකරණය වී ඇත්ද යන්න තක්සේරු කල යුතු වුවත් එසේ සිදු නොකර අනෙකුත් වත්කම්, ලැබිය යුතු දෑ හා තැන්පතු සහ අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ ලෙස පිළිවෙලින් වාර්ෂිකව රු.200,000 ක්, රු.1,407,972 ක් හා රු.1,433,947 ක් වසර පහකට අධික කාලයක සිට ගිණුම්වලට ගැළපීම් කර තිබුණි.

(ඌ) අධිකාරිය විසින් රු.420,285,840ක් වැය කර ඉදිකල මැණික් කුළුණ ගොඩනැගිල්ලෙහි මහල් 03 ක පැවති කඩ කාමර 27ක් නිස් අවුරුදු බදු පදනම් මත හා ආපනශාලාව කුලියට ලබා දීම සඳහා වෙන් කර තිබුණි. ඒ අනුව ගොඩනැගිල්ලෙහි වටිනාකම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 40 ප්‍රකාරව ආයෝජන දේපලක් ලෙස වාර්තා කිරීම වෙනුවට දේපල පිරියත හා උපකරණ යටතේ ගොඩනැගිල්ලක් ලෙස දක්වා තිබුණි.

(එ) ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම් ගිණුම්ගත කිරීමේදී රු.3,718,340 ක් වූ පොලී මත අයකළ රඳවාගැනීමේ බදු අඩුකර ආදායම් හඳුනාගෙන තිබුණි. තවද, ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම් රු.487,885,070 ක් වූවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.397,810,120 ක් ලෙස රු.90,074,950 ක් අඩුවෙන්ද, මීට අදාල ලැබිය යුතු පොලී ආදායම් රු.1,917,264 ක් අඩුවෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ රත්නපුර පැවති ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සඳහා වැයකල රු.8,042,333 ක් වූ වියදම් බිල්පත් 04ක් සමාලෝචිත වර්ෂයේ වියදම් වලින් අත්හැරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අධිගණනය වී තිබුණි.

(ඔ) වැටලීම් සඳහා ත්‍යාගලාභීන්ට ගෙවිය යුතු රු.70,922,416 ක මුදල් මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස පෙන්වීම් වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි නිමිකම් යටතේ මැණික් ත්‍යාග අරමුදල් ලෙස දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඞ) අධිකාරිය සතු විදේශ විනිමය තැන්පතු තුනක සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති එකතුව ඇ.ඩො.13,964.33 ක ශේෂ වර්ෂය අවසාන දිනට පැවති හුවමාරු වටිනාකමට අගය කිරීම වෙනුවට ගනුදෙනු සිදුවූ අවස්ථාවේ පැවති අනුපාතයන් මත ගණනය කර තිබුණි. මේ හේතුවෙන් රු.4,026,325 ක් වූ ශේෂය වෙනුවට රු.4,610,110ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.583,784 කින් මුදල් හා මුදල් සමාන දෑ හි වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත්, නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (ආ),(ඇ),(ඊ), (ඌ) ඡේද මඟින් දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත	
(i) 14(1)ඊ වගන්තිය	නීති විරෝධී මැණික් ගැරීම, නීති විරෝධී ලෙස මැණික් ලංකාවෙන් ඉවත් කිරීම වැලැක්වීමට අධිකාරිය ක්‍රියාත්මක විය යුතු වුවද, අධිකාරියේ මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය විසින් 2024 වර්ෂයේ සිදු කළ වැටලීම් අවස්ථා 38 කදී බලපත්‍ර ලබා නොගෙන ට්‍රිපර් රථ යොදා ගනිමින් ඉල්ලම් ප්‍රවාහනය, අනවසරයෙන් රජයේ ඉඩම් වල පතල් කැණීම් හා ගහ රක්ෂිතයට හානි වන ලෙස පතල් කැණීම සිදු කර තිබුණි. තවද අවස්ථා 46 කදී බලපත්‍ර කොන්දේසි කඩකර තිබුණද පරිසරයට අහිතකර ලෙස හා අවදානම් සහගත ලෙස සිදුවන නීතිවිරෝධී පතල් කැණීම් හා මැණික් ගැරීම් වැලැක්වීමට දඩ මුදල් අය කිරීම හැර වෙනත් නෛතික ක්‍රියාමාර්ග කෙරෙහි අධිකාරිය අවධානය යොමු කර නොතිබුණි.
(ii) 15(1) වගන්තිය	මැණික් කර්මාන්ත විෂයට අදාළ ප්‍රධාන නියාමන අධිකාරිය තුන්වන පාර්ශවය සමඟ සෘජුවම මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල නියැලීම පනතේ 15(1) වගන්තියට පටහැනි බවට 2019 මාර්තු 25 දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණද මැණික් ගැරීම් ව්‍යාපෘති සිදුකිරීම සම්බන්ධව අවසන් තීරණයක් ගෙන නොතිබුණි.
(iii) 15(2) වගන්තිය	මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

(iv) 20(1) වගන්තිය	අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් හා පරිත්‍යාග අධිකාරියේ අරමුදලට බැර කළ යුතු බවත්, තෑගි මුදල් ගෙවීම එම අරමුදල භාවිත කරමින් සිදු කළ යුතු බවත් දක්වා තිබුණ ද ඉල්ලම් වෙන්දේසි කිරීමෙදී ලැබෙන මුදල් සහ අධිකාරිය විසින් නියම කරන ලද දඩ මුදල් බැර කිරීම සඳහා ත්‍යාග අරමුදල නම් අරමුදලක් ද, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන තැනැත්තන්ගේ ජීවිත හා ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා වීමට ගතයුතු ආරක්ෂක පියවර විධිමත් කිරීම සඳහා මැණික් ගැරීම් සුභසාධන අරමුදල නම් අරමුදලක්ද, ස්වර්ණාභරණ නිෂ්පාදකයින්ගේ තාක්ෂණික සංවර්ධනය උදෙසා ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල නම් අරමුදලක්ද වශයෙන් අරමුදල් 03 ක් ස්ථාපිත කර තිබුණි. ප්‍රධාන අරමුදලට අතිරේකව අරමුදලක් පවත්වා ගෙන යයි නම් භාණ්ඩාගාර අනුමැතිය මත සිදු කල යුතු නමුත් එවන් අනුමැතියකින් තොරව 2024 දෙසැම්බර් 31 දිනට ත්‍යාග අරමුදලේ රු.70,922,416 ක ශේෂයක්ද, මැණික් ගැරීම් සුභ සාධක අරමුදලේ රු.40,741,334 ක ශේෂයක්ද, ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලේ රු.101,455,508 ක ශේෂයක් ද, සහිතව පවත්වාගෙන ගොස් තිබුණි.
(ආ) 2017 අංක 24 දරන දේශීය අදායම් පනතේ 86 වගන්තිය සහ දේශීය ආදායම් කොමසාරිස්ගේ අංක SEC/2022/E/03 හා 2022 දෙසැම්බර් 23 දරන රඳවා ගැනීම් අනු නියෝජිතයන් වෙත නිකුත් කළ රඳවා ගැනීම් බද්ද සහ අත්තිකාරම් බදු අඩුකිරීම් චක්‍රලේඛයේ අංක 06 ඡේදය	සෑම රඳවා ගැනීම් අනුනියෝජිතයකු විසින්ම එකතු කළ රඳවා ගැනීම් බදු එක් එක් ලිත් මාසය අවසාන වී දින 15ක් ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේශණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා රැස්කරන ලද රු.513,495,637 ක් හා 2024 වර්ෂයට පෙර රැස් කරගත් රු.491,428,327 ක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඇ)	2018 අගෝස්තු 29 දිනැති අංක NGJA/16.2/2018/Bachoe III දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 07 ඡේදය	මැණික් ගැරීමෙන් පසු භූමිය යථාවත් කිරීම කළ යුතු වන අතර, එසේ නොමැතිව අනතුරුදායක සහ පරිසරයට හානිකර ආකාරයට අතහැර දමා ඇති අවදානම් සහගත පතල් වලවල්, බලපත්‍රය අවලංගු වී මාස 02 කින් පසුව අධිකාරිය විසින් වසා දමා භූමිය යථාවත්කල යුතු වේ. මෙම පතල් භූමි ප්‍රතිසංස්කරණ සඳහා අධිකාරිය තැන්පතුවක් ලබාගෙන තිබුණි. මෙලෙස ලබාගන්නා තැන්පතුවල ශේෂය වාර්ෂිකව වැඩි වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම තැන්පතු ගිණුමේ රු.1,760,351,594ක ශේෂයක් පැවතුණි. එසේ වුවද, මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය කර තිබේද යන්න පිළිබඳව අධිකාරිය නිසි නියාමනයක් හෝ අධිකාරිය විසින් පතල් භූමි ප්‍රතිසංස්කරණය සඳහා විධිමත් සැලසුමක් සහිතව කටයුතු සිදු කර හෝ නොතිබුණි. නියැදි පරීක්ෂණයකින් අනාවරණය වූ පරිදි පතල් වලවල් 16ක් 2025 මැයි දක්වා වසා දමා නොතිබූ අතර මෙම පතල් වලවල් වසර 10කට පමණ පෙර මැණික් ගැරීමට අමතරව විවිධ කාර්යයන් සඳහා (වැලි / පස් කැනීම) යොදා ගත් ඉඩම් වූ අතර, බලපත්‍ර ලබාගත් නිශ්චිත පුද්ගලයන් පිළිබඳ විස්තරද අධිකාරිය සතුව නොතිබුණි.
(ඈ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 2.2.2.(අ)ii වගන්තිය	මාසයකට එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක්වත් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08ක් පමණක් පවත්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

(ඉ) 2022 මැයි 18 දිනැති අංක NGJA/EXP/2/2022 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ

(i) 04 ඡේදය	මැණික් හා ස්වර්ණාභරණ වෙළඳපොළ වටිනාකම දැක්වෙන ලේඛනය සෑම මාස 03 කට වරක් වැඩ කරන පලමු දින යාවත්කාලීන කරමින් අධිකාරියේ වෙබ් අඩවියේ පල කළයුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි.
(ii) 05 ඡේදය	තොරතුරු යාවත්කාලීන කර වෙබ් අඩවියේ පල නොකිරීම හේතුවෙන් මැණික් හා ස්වර්ණාභරණ තොග පරීක්ෂාකර වෙළඳපොළ වටිනාකම සමඟ සසඳා බැලීමට හා චක්‍රලේඛයෙහි අංක 6, 7, 8, 9, 10 ඡේදවල සඳහන් පරිදි ඉන්වොයිසියේ වටිනාකම වෙළඳපොළ වටිනාකමට වඩා වෙනස් වන විට අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට නොහැකි වී තිබුණි.
(iii) 07(i) ඡේදය	මැණික් අපනයනකරුවන්ගේ ඉන්වොයිස් වටිනාකම හා තක්සේරු වටිනාකම අතර සියයට 30 දක්වා වන වෙනස්කම් සංශෝධනය නොකර අපනයනය කිරීමට අනුමැතිය දී තිබීම හේතුවෙන් වැඩිවෙන ඉන්වොයිස් වටිනාකමට අදාල සේවා ගාස්තු ආදායම් අධිකාරියට අහිමි වී තිබුණි. මැණික්වල සත්‍ය විකුණුම් වටිනාකමට වඩා ඉන්වොයිසියේ සඳහන් වටිනාකම පමණක් අපනයන වලින් ලද ආදායම ලෙස ප්‍රේෂණය කිරීමේ ප්‍රවනතාවයක් අපනයනකරුවන් තුළ පවතින පසුබිමක විශාල වටිනාකම් සහිත අපනයනවල ඉන්වොයිස් වටිනාකම උක්ත අනුමැතිය මත වෙනස් නොකිරීම තුළ රට තුලට ප්‍රේෂණය වන විදේශ විනිමය ප්‍රමාණය අඩු වන තත්ත්වයක් පැවැතුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Poldúwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) අධිකාරිය විසින් රු.මිලියන 19 ක පිරිවැයකට ආයතනයේ භාවිතය සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ මෘදුකාංග සැපයුම් ආයතනයක් සමඟ මාස 11 ක කාලයක් සඳහා ගිවිසුම් ගත වී 2024 වර්ෂය වන විට රු.10,925,000 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ප්‍රසම්පාදන කටයුතු සිදු කර වසර 08ක් ගතව තිබුණ ද 2024 දෙසැම්බර් 31 දින වන විටත් මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම සාර්ථකව අවසන් කර තිබුණි.

(ආ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනත 1993 වර්ෂයේ අනුමත කර ගැනීමෙන් පසුව එය කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි.

(ඇ) අධිකාරිය ආරම්භ කර තිබූ මැණික් ගැරීම් ව්‍යාපෘති 02 ක් සමාලෝචිත වර්ෂය වන විට තාවකාලිකව නතර කර තිබූ අතර එම ව්‍යාපෘති වෙනුවෙන් රු.1,795,172 ක වියදමක් දරා තිබුණි.

(ඈ) මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන්ට කඩ කාමර ලබාදීම සඳහා අධිකාරිය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථාන සමාගම අතර ඇති කරගෙන තිබූ බදු කුලී ගිවිසුම් 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබුණ ද, අධිකාරිය විසින් 2004 - 2018 කාලය තුළ සමාගමට වරින් වර ගෙවා තිබූ ආරක්ෂිත ඇප තැන්පතු රු.4,314,837 ක් නැවත අය කරගෙන නොතිබුණි.

(ඉ) තැන්පතු හා අත්තිකාරම් යටතේ ටෙන්ඩර් තැන්පතු වශයෙන් රු.11,168,580 ක් වූ ශේෂ පැවති අතර ඒ තුළ තොරතුරු නිශ්චිතව වාර්තාකර නොමැති වසර 10 ට වැඩි කාලයක් තිස්සේ පවතින එකතුව රු.1,842,675 ක් වටිනා තැන්පතු 130 ක් වූ අතර මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඊ) ශ්‍රී ලංකා රේගුව හරහා 2022, 2023 සහ 2024 වර්ෂ තුන තුළ රු.2,091,693,980 ක් වටිනා මැණික් කිලෝ ග්‍රෑම් 46,815.94 ක් ආනයනය කර තිබුණු අතර, ඊට අදාලව සමාජ ආරක්ෂණ බද්ද රු.15,614,849 ක් ද, එකතු කළ අගය මත බදු රු.38,616,009 ක්ද, 2024 වර්ෂයේදී අය වී තිබුණි. මෙම වසර තුන තුළදී රු.22,523,409 ක් වටිනා මැණික් කිලෝ ග්‍රෑම් 1,664.06 ක් පමණක් රු.10,723,623 ක අගයක් එකතු කර අධිකාරිය හරහා ප්‍රති අපනයනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂවලදී සමස්ථ මැණික් ආනයන පිළිබඳව තොරතුරු ආයතනය සතුව නොතිබූ අතර ආනයන පිළිබඳව නියාමන ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර ද නොතිබුණි.

(උ) මැණික් සහිත ප්‍රදේශ අනවසර මැණික් ගැරීම්වලින් වළක්වා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කර නිත්‍යානුකූලව මැණික් ඉවත් කිරීමට අපේක්ෂා කර කුඹුක්කන් ඔය ආශ්‍රිතව ජලාශයට යටවන භූමියේ පර්යේෂණ නියමු පතල් කැනීම් ව්‍යාපෘතියක් සිදු කිරීමට අධිකාරිය විසින් රු.5,757,000 ක ඇස්තමේන්තුවක් සකස් කර රු.750,000 ක් 2021 වර්ෂයේදී වැයකර තිබුණි. මෙහිදී කැරට් 600 ක පමණ මැණික් හමුවී තිබූ අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදී නොමැති වීමෙන් ඉදිරි කටයුතු නතර වී තිබුණි. අධිකාරිය විසින් සිදු කරන ලද පර්යේෂණවල දත්ත අනුව දළ වශයෙන් රු.බිලියන 10 ක පමණ මැණික් පැවතීමේ ශක්‍යතාව මත ව්‍යාපෘතිය සඳහා එකඟතාව ලබා දෙන ලෙස නැවතත් අධිකාරිය විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත 2024 අප්‍රේල් 19 දින ඉල්ලීම් කර තිබූ නමුත් එයට ප්‍රතිචාර ලැබී නොමැති අතර මේ වන විටත් එම ඉඩමේ අනවසර කැනීම් සිදුවෙමින් පැවතුණි.

(ඌ) මැණික් ගල් තාපකරණයට ලක් කර තිබේද නැත්ද යන්න හඳුනා ගැනීම සඳහා පිරිවැය එකතුව රු.16,379,110 ක් වූ FTIR යන්ත්‍ර දෙකක් රත්නපුර කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය සඳහා 2013 හා 2020 වර්ෂවල මිලට ගෙන තිබුණු අතර, යන්ත්‍ර මිලදීගත් දින සිට 2025 මාර්තු මාසය දක්වා සහතික පත් 07 ක් පමණක් නිකුත් කර තිබුණි. 2020 වර්ෂයේ මිලදී ගත් යන්ත්‍රයේ මිලදී ගැනීම් ගිවිසුම අනුව නිෂ්පාදිත ආයතනය විසින් නිලධාරීන් දෙදෙනෙකු සඳහා ලබා දීමට එකඟ වී ඇති විදේශ පුහුණුව වසර 05 ක් ගත වී ඇතත් මේ දක්වා ලබාගෙන නොතිබුණු අතර, මෙම යන්ත්‍ර සඳහා සේවා ගිවිසුම්වලට ද එළඹ නොතිබුණි. වර්තමානය වනවිට යන්ත්‍ර නිසි ලෙස ක්‍රියාකරවීමට පුහුණු ශ්‍රමිකයන් හා දත්ත ගොනු නොමැති වීම නිසා යන්ත්‍ර උපරිම කාර්යක්ෂමතාවයෙන් ක්‍රියාත්මකව නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(එ) අධිකාරිය සතුව පවතින වටිනා ලෝහ විශ්ලේෂණය කිරීම සහ මුද්‍රා තැබීම සඳහා යොදාගනු ලබන Lesser Marking යන්ත්‍ර 06 ම 2024 මාර්තු 15 දින වන විට අක්‍රිය වී තිබීම මත එදින සිට Manual Hallmarking පමණක් සිදුවන අතර විගණිත දිනය වූ 2025 මැයි 28 දින දක්වාම එම යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට නොහැකි වී තිබුණි. පිරිවැය රු.52,540,888 ක් වූ එලදායි ජීවකාලය අවසන් වී නොමැති මෙම යන්ත්‍ර 06 අලුත්වැඩියාවන් හා සේවා කිරීම් සම්බන්ධයෙන් ගිවිසුම් ගතවී ද නොතිබූ අතර මේ හේතුවෙන් යන්ත්‍ර භාවිතයෙන් තොරව අක්‍රියව තැබීමට සිදුවී තිබුණි. තවද 2020 වර්ෂයේ මිලදී ගත් Lesser Marking යන්ත්‍ර දෙක මිලදී ගැනීමේ ගිවිසුම් අනුව නිලධාරීන් දෙදෙනකු වෙත නිෂ්පාදන සමාගම විසින් ලබා දීමට එකඟ වී ඇති විදේශීය පුහුණුව වසර 04 ක් ගතවී ඇතත් අධිකාරියේ නිලධාරීන් සඳහා ලබා ගැනීමට කටයුතු නොකර අදාල යන්ත්‍රය මිලදී ගැනීමේ බිල්පත තුළ ඇතුළත් රු.900,000 ක නිලධාරීන් පුහුණු කිරීමේ පිරිවැය 2025 පෙබරවාරි 27 දින නැවත අය කර ගෙන තිබුණි.

(ඒ) අධිකාරියේ නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් කතරගම ප්‍රදේශය තුළ නිවාඩු නිකේතනයක් ඉදිකිරීමට 2016 වර්ෂයේ රු.2,444,580 ක් වැයකර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් ලබාගත් පර්වස් 39.84 ක ඉඩම අදාල කාර්යය සඳහා භාවිතා නොකර වසර 09 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. එකී ඉඩම අනවසර පදිංචිකරුවන්ගේ බලපෑම් සහිත ඉඩමක් බව දෙපාර්ශවයම දැනුවත්ව සිටිය ද ඉඩම මිලදී ගැනීමට අධිකාරිය කටයුතු කර තිබුණු අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට නීතිමය ක්‍රියා මාර්ග ද ගෙන නොතිබුණි.

(ඔ) අධිකාරිය විසින් ජාත්‍යන්තර මැණික් වෙළඳ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා ඉදිකරන ලද මැණික් කුළුණ ගොඩනැගිල්ලෙහි අවුරුදු 30 කට බදු පදනම මත ලබා දීමට යෝජිත කඩ සාප්පු 27න් සාප්පු 14 ක් පමණක් බදු දී තිබූ අතර ඉතිරි කඩ සාප්පු 13 හා ආපනශාලාව වසරක කාලයක් තිස්සේ ඌන උපයෝජිතව පැවතුණි. බදු පදනම මත ලබා දී තිබූ කඩ කාමර 05කට අදාලව 2024 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.2,179,890 ක කුලී මුදලක් හිඟව පැවතුණි. මේ හේතුවෙන් එක් කඩ කාමරයක් නැවත අධිකාරිය වෙත පවරා දී තිබූ අතර කඩසාප්පු 04 ක් මුද්‍රා තැබීමට නියමිතව තිබුණි. බදු පදනම මත ලබා දී තිබූ කඩ සාප්පු 04ක් වෙන්දේසි කිරීමේදී මුදල් ගෙවා වෙන් කර ගැනීමෙන් පසුව ගිවිසුම්ගත වීමට මාස 08 ක පමණ කාලයක් ගත වීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට උපයා ගැනීමට හැකිව තිබූ රු.1,250,000 ක ආදායමක් අධිකාරියට අහිමි වී තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

(ඔ) ශ්‍රී ලංකාවේ අංග සම්පූර්ණ මැණික් රසායනාගාරයක් ඇති කිරීමේ අරමුණින් මැණික් අපනයන වටිනාකම මත අධිකාරිය අයකර ගන්නා 0.25% ක අපනයන සේවා ගාස්තුවට අමතරව 2001 වසරේ ජනවාරි සිට තවත් 0.25% ක අපනයන සේවා ගාස්තුවක් අපනයනකරුවන්ගෙන් අය කර ගෙන අධිකාරිය සහ ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ සංගමය අතර ඇතිකර ගත් එකඟතාවයක් මත ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි නමින් සීමා සහිත පෞද්ගලික සමාගමක් 2008 මැයි මස 29 වන දින ස්ථාපිත කර තිබුණි. 2009 ජනවාරි 28 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව ඉහත පරිදි එකතු කරගන්නා ලද රසායනාගාර සංවර්ධන අරමුදලේ එකතු වූ රු.92,498,578 ක මුදල 2009 අප්‍රේල් 27 දින උක්ත සමාගමේ ගිණුමට බැර කර තිබුණි. සමාගම ස්ථාපනය කර 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 16 ක් ඉක්මවා තිබුණ ද සමාගමේ අරමුණ වූ රසායනාගාරය පිහිටුවීම ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. සමාගමෙහි ගිණුමට බැර කරන ලද රු.92,498,578 ක මුදල හා ඊට අදාළ පොළිය අධිකාරියේ අරමුදලට නැවත මාරු කිරීමටත් එම අරමුදල් උපයෝගී කරගනිමින් යෝජිත ජාත්‍යන්තරව පිළිගත් උසස් තාක්ෂණික රත්න විද්‍යා රසායනාගාරයක් අධිකාරිය යටතේ ස්ථාපිත කිරීමටත් 2016 අගෝස්තු 24 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණ ද වර්ෂ 08 ක් ඉක්මවා තිබියදීත් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කර නොතිබුණි. සමාගමට අදාළව 2014/2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ලංකා බැංකුව විසින් තහවුරු කර ඇති පරිදි සමාගමේ ස්ථාවර තැන්පතුවේ 2024 දෙසැම්බර් 31 දිනට රු.251,134,797 ක ශේෂයක් පැවති අතර ජංගම ගිණුමේ රු.25,841,283 ක ශේෂයක් නිෂ්කාර්යව පැවතුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

15